# බෝග නිෂ්පාදන වැඩසටහන - 2025

# பயிர் உற்பத்தி திட்டம் - 2025

# Crop Production Programme - 2025


කෘෂිකර්ම, ඉඩම්, පශු සම්පත්, වාරිමාර්ග, ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය

கமத்தொழில், காணி, கால்நடை, நீர்ப்பாசன, மீன்பிடி மற்றும் நீரியல்வளங்கள் அமைச்சு

Ministry of Agriculture, Lands, Livestock, Irrigation, Fisheries and Aquatic Resources

## කෘෂිකර්ම අමාත්‍යතුමාගේ පණිවිඩය

දේශීය කෘෂිකර්මාන්තය තුළින් ස්වයංපෝෂිත අර්ථ ක්‍රමයක් ගොඩ නැගීමේ ඉලක්කය ජය ගැනීම සඳහා වාර්ෂික බෝග නිෂ්පාදන වැඩසටහන වැදගත් වේ යැයි සිතමි. ඒ සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය මෙන් ම ඊට අනුබද්ධ ආයතන සියල්ල එක් අරමුණක් වෙනුවෙන් වාර්ෂික බෝග නිෂ්පාදන වැඩසටහනට දායකත්වය සැපයිය යුතුව ඇත.

එනයින් ගත් කල, ප්‍රමුඛ කාර්යයක් ලෙස සලකා දේශීය වශයෙන් නිෂ්පාදනය කළ හැකි සියලුම ආහාර බෝග රට තුළ ම වගාකර, ආනයනය හැකි තරම් සීමා කිරීම ඉතා වැදගත් ය. එමගින් ආනයනයට වැයවන දේශීය ධනය ඉතිරි කර ගත හැකි වනු ඇත. තව ද දේශීය කෘෂි නිෂ්පාදනයට ජාත්‍යන්තර වෙළඳපොළ තුළ අවස්ථාව ලබා ගැනීමට හැකි වනු ඇත.

කෘෂි නිෂ්පාදන දේශීයව නිෂ්පාදනය කිරීමෙන් ගොවි ප්‍රජාවට සාධාරණ මිලක් ලබා ගත හැකි අතරම, පාරිභෝගිකයාට ද සාධාරණ මිල ගණන් යටතේ කෘෂි බෝග මිල දී ගැනීමට ඉඩ ප්‍රස්ථාව හිමි වේ. එමඟින් ගොවියා, වෙළෙන්දා සහ පාරිභෝගිකයා යන සමස්ත පාර්ශවයන්ට සහන සැලසෙනු ඇත.

සාම්ප්‍රදායික කෘෂිකර්මාන්තය අතික්‍රමණය කරමින් නවීන තාක්ෂණය මුසු කරගත් නව කෘෂි නිෂ්පාදන ඇති කිරීම වැදගත්ය. එහි දී අපනයනය හා කෘෂි නිෂ්පාදන ඉලක්ක කරගත් වැඩපිළිවෙලක් වෙත පිවිසීමට දේශීයව අවස්ථාව සැලසෙනු ඇත.

පාරම්පරික කෘෂි බෝගවල අනන්‍යතාවය සුරකිමින් නව බෝග හඳුන්වා දෙමින් කෘෂිකාර්මික අංශයේ නව පුනරුදයක් ඇති කිරීමේ ඉලක්කය සපුරා ගැනීමෙහිලා අවැසි වටපිටාව ගොඩනැඟීමට කෘෂිකර්ම අමාත්‍යාංශය ඇතුළු ඒ හා සම්බන්ධ සෙසු ආයතනවල දායකත්වය අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා ඔබ සැමට අවැසි ශක්තිය හා ධෛර්යය ප්‍රාර්ථනා කරන අතරම, එම වගකීම වෙනුවෙන් කැප වීමට මම ඔබ සැමට ඇරයුම් කරමි.

අනුර කුමාර දිසානායක

කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, පශු සම්පත්, ධීවර හා ජලජ සම්පත් අමාත්‍ය

**කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්තුමාගේ පණිවිඩය**

කෘෂිකර්මාන්තය ශ්‍රී ලංකාවේ ආර්ථිකය හා ආහාර සුරක්ෂිතතාවය කෙරෙහි ප්‍රධාන බලපෑමක් සිදු කරන අංශයකි. භූගෝලීය හා දේශගුණික පිහිටීම අනුවද ශ්‍රී ලංකාව සර්ම කලාපීය, ස්වාභාවික සම්පත් වලින් සපිරි, කෘෂිකර්මාන්තයට හිතකර රටක් වන බැවින් ඊට නවීන තාක්ෂණයේ පර්යේෂණ හා විද්‍යාත්මක යෙදවුම් ද උපයෝගී කර ගැනීම තුළින් ගොඩනැගෙන තිරසර කෘෂිකාර්මික සංවර්ධනය රටෙහි ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීමට ඉවහල් වේ. තෝරාගත් බෝගවල මෙරට අවශ්‍යතාවය, රටේ නිෂ්පාදනය තුළින් ම සපුරා ගැනීම, ආනයනය අවම කිරීම, අපනයනය වැඩි කිරීමත් මගින් රටේ ආහාර අවශ්‍යතාවය සපුරා ගැනීමටත් රටේ දළ දේශීය නිෂ්පාදනයට සෘජු දායකත්වයක් ලබා දීමත් මෙම අමාත්‍යාංශයේ මූලික අභිප්‍රායන් වේ. ඒ සඳහා ගොවිකමෙන් ඔබ්බට ගොස් කෘෂි ව්‍යාවසායකයින් බිහි කිරීමෙහි ලා මූලිකත්වය ගෙන කටයුතු කරනු ලබයි.

දේශීය බෝග නිෂ්පාදනය දිරි ගන්වමින් තිරසර කෘෂිකාර්මික සංවර්ධනය තුළින් සමාජ-ආර්ථික ප්‍රගතිය ළඟාකර ගැනීම කෘෂිකර්ම, ඉඩම්, පශු සම්පත්, වාරිමාර්ග, ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය ඇතුළු ඒ යටතේ පවතින කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව යන සියලු ආයතනවල ප්‍රධාන මෙහෙයුම වේ.

වාර්ෂික බෝග අවශ්‍යතාවයට අදාලව වාර්ෂිකව නිකුත් කරන මෙම ග්‍රන්ථය ප්‍රකාශයට පත් කිරීමේ අභිලාෂය වන්නේ ඉදිරි කන්නවල නිෂ්පාදන සැළසුම් ඉදිරිපත් කිරීමත් තෝරාගත් බෝගවල කන්න වගා ඉලක්ක සාධනීය ලෙස ජයගැනීමත් වේ.

2024/25 මහ සහ 2025 යල කන්නවල බෝග නිෂ්පාදන වැඩසටහන ග්‍රන්ථය සකස් කිරීම සඳහා සහයෝගය ලබා දීමට කටයුතු කළ සියලුම දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂවරු, පලාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරු, කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිලධාරීන්, කෘෂි සංවර්ධන අංශයේ සියලුම නිලධාරීන් සහ කෘෂිකර්ම අමාත්‍යාංශයේ සංඛ්‍යා ලේඛන අංශයට ද මාගේ විශේෂ ප්‍රණාමය පුද කරමි.

එම්.පී. එන්.එම්. වික්‍රමසිංහ

ලේකම්

කෘෂිකර්ම, ඉඩම්, පශු සම්පත්, වාරිමාර්ග, ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය

**කෘෂි සංවර්ධන අතිරේක ලේකම්තුමියගේ පණිවිඩය**

භූගෝලීය පිහිටීම හා දේශගුණික විවිධත්වය හේතුවෙන් ශ්‍රී ලංකාව ඈත අතීතයේ සිටම ආහාර බෝග වලට අමතරව බෝග විවිධත්වයක් සහිත වැවිලි කේන්ද්‍රස්ථානයක් විය. එදා සිට මේ දක්වා කෘෂිකර්මාන්තය රටේ ආහාර සුරක්ෂිතතාවය තහවුරු කරන අතර දළ දේශීය නිෂ්පාදනයට සෘජුව දායකවන ප්‍රමුඛ අංශයක් වූ බව දැක්විය හැක.

රට තුළ ආහාර අවශ්‍යතාවය සැපිරීමට පමණක් සීමා නොවී, ආනයනය අවම කිරීම, අපනයනය මගින් විදේශ විනිමය උපයා ගැනීමට ද මෙම අමාත්‍යාංශය පුරෝගාමීව කටයුතු කරනු ලබයි. ඒ සඳහා 'ගොවීන්' යන සංකල්පයෙන් ඔබ්බට ගොස් 'තරුණ කෘෂි ව්‍යවසායකයින්' යන සංකල්පය තුළින් රටේ ජවසම්පන්න තාරුණ්‍යය, නවීන තාක්ෂණයේ මුසුව ද සමගින් වඩාත් සුහුරු අන්දමින් කෘෂිකර්මාන්තය වෙත නැඹුරු කරලීමට මේ වන විටත් පියවර ගෙන ඇත.

මෙම බෝග නිෂ්පාදන සැලැස්ම තුළින් රටෙහි ආහාර අවශ්‍යතාවය පදනම් කර ගනිමින් ඉදිරි ආහාර බෝග නිෂ්පාදනය සම්බන්ධ දත්ත, දිස්ත්‍රික් හා පළාත් මට්ටමින් විශ්ලේෂණාත්මකව හා සංසන්දනාත්මකව පුරෝකථනයක් ලබා දීමට කටයුතු කර ඇත.

2024/25 මහ සහ 2025 යල කන්නවල බෝග නිෂ්පාදන වැඩසටහන සකස් කිරීම සඳහා තොරතුරු ලබා දෙමින් සහයෝගය ලබා දීමට කටයුතු කළ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු සියලු නිලධාරීන්ටත්, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් ඇතුළු අනෙකුත් අදාල නිලධාරීන්ටත්, සියලුම දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන්ටත්, සියළුම පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන් හා අදාල නිලධාරීන්ටත්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හා ජල කළමනාකරණ අංශයේ අදාල සියළු නිලධාරීන්ටත්, අධ්‍යක්ෂ (කෘෂි සංවර්ධන) ඇතුළු එම අංශයේ සියලුම නිලධාරීන්ටත්, කෘෂිකර්ම අමාත්‍යාංශයේ සංඛ්‍යාලේඛන අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ඇතුළු අදාල අනෙකුත් නිලධාරීන්ටත් මාගේ ගෞරවනීය ස්තූතිය පුද කරමි.

සුසන්ති චන්ද්‍රසේන

අතිරේක ලේකම් (කෘෂි සංවර්ධන)

කෘෂිකර්ම, ඉඩම්, පශු සම්පත්, වාරිමාර්ග, ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය

## CONTENTS


**Page No.**

**Summary**

Paddy ........ 01

Other Field Crops & Vegetable ........ 02

Fruits ........ 03

**Paddy Cultivation**

**Paddy**

Production - Targets ........ 05

Seed Paddy Requirement (3 - 3 1/2 Months Age Class) -Maha 2024/25 & Yala-2025 ........ 09

Seed Paddy Requirement ( 4 - 4 1/2 Months Age Class) -Maha 2024/25 & Yala-2025 ........ 21

Fertilizer Requirement -Maha 2024/25 & Yala-2025 ........ 27

Abandoned Extent(Hectares) ........ 28

Yaya Production Program ........ 29

**Other Field Crop Cultivation**

**Production Targets and seeds and Fertilizer Requirement**

Chilli ........ 31

Red Onion ........ 32

Big Onion ........ 33

Cowpea ........ 34

Green Gram ........ 35

Black Gram ........ 36

Soy Bean ........ 37

Ground Nut ........ 38

Maize ........ 39

Kurakkan ........ 40

Gingelly ........ 41

Production Targets in 3rd Season ........ 42

**Vegetable Cultivation**

**Production Targets and Seeds and Fertilizer Requirement**

Beans ........ 44

Capsicum ........ 45

Tomato ........ 46

Cabbage ........ 47

Carrot ........ 48

**Page No.**


Beet Root ........ 49
Raddish ........ 50
Knolkhol ........ 51
Leeks ........ 52
Long Beans ........ 53
Bushitavo ........ 54
Okra ........ 55
Luffa ........ 56
Snake Gourd ........ 57
Bitter Gourd ........ 58
Cucumber ........ 59
Pumpkin ........ 60
Brinjal ........ 61
Winged Beans ........ 62
Ash Plantain ........ 63
Murunga ........ 64
Leafy Vegetables ........ 65
Indigenous Root & Tuber Crops ........ 66
Potato ........ 67
Sweet Potato ........ 68
Manioc ........ 69

**Fruit Crop Cultivation**

**Production Targets and seeds and Fertilizer Requirement**

Banana ........ 71
Pineapple ........ 72
Mango ........ 73
Passion Fruit ........ 74
Papaw ........ 75
Rambutan ........ 76
Orange ........ 77
Lemon / Lime ........ 78
Avocado ........ 79
Guava ........ 80
Mandarin ........ 81
Pomegranate ........ 82
Water Melon ........ 83